සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2020 ජූලි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

2020-09-26
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) ***ප්‍රස්තාර කොළ** සපයනු ලැබේ.*
  - (7) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (8) *ලකුණු 100 යි.*

---

## A කොටස

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** මූලික ආර්ථික ප්‍රශ්න පවතින්නේ:

(1) ආදායම වැඩිවීම සමඟ පරිභෝජනය වැඩිවන නිසාය.

(2) ආර්ථික සම්පත් මාරුකළ නොහැකි නිසාය.

(3) භාණ්ඩ සහ සේවා නිපදවීමට සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය කර නොමැති නිසාය.

(4) සියලුම වුවමනා සපුරාලීමට සම්පත් ප්‍රමාණවත් නොවීම නිසාය.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යවසායකත්වය සඳහා ඇති ප්‍රතිලාභය (reward) වන්නේ කුමක් ද?

(1) වැටුප්. (2) පොලිය. (3) ලාභය. (4) බදු කුලිය.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, රජය විසින් දරණ ලද ප්‍රාග්ධන වියදමකට උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) ණය සඳහා පොලී ගෙවීම්. (2) පුනරාවර්තන මාරුකිරීම්.

(3) මූර්ත වත්කම් මිලදී ගැනීම. (4) සහනාධාර සැපයීම.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ උපකල්පනයක් වන්නේ කුමක් ද?

(1) තාක්ෂණය ස්ථාවර නොවේ.

(2) භාණ්ඩ දෙකක් පමණක් නිෂ්පාදනය කරයි.

(3) සියලුම පවතින සම්පත් ස්ථාවර නොවේ.

(4) සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය නොකෙරේ.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, පූර්ණ තරඟයේ ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?

(1) සමජාතීය භාණ්ඩ නිපදවීම.

(2) අබාධ පිවිසුම (free entry) හා පිටවීම.

(3) භාණ්ඩයේ මිල විකුණුම්කරු විසින් පමණක් තීරණය කරයි.

(4) වෙළෙඳපොළේ ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම.

1.6 ආයතනයක් සඳහා මාසයක පිරිවැය තොරතුරු පහතින් ඔබට ලබා දී ඇත:

| | රු. |
|---|---|
| සෘජු පිරිවැය | 180,000 |
| වක්‍ර පිරිවැය | 45,000 |

ආයතනය මාසය තුළ ඒකක 2,500 ක් නිපදවා විකුණා ඇති අතර, විකුණුම් මිල ඒකකයක් රු.100/- බැගින් විය.

ඉහත තොරතුරු මත පදනම්ව, මාසය සඳහා ආර්ථික ලාභය වන්නේ:

(1) රු.70,000/-. (2) රු.25,000/-. (3) රු.205,000/-. (4) රු.225,000/-.

1.7 එකම පිරිවැයක් යටතේ භාණ්ඩයක් හෝ සේවාවක් වෙනත් රටවල්වලට වඩා වැඩි ප්‍රමාණයකින් කිසියම් රටකට නිපදවිය හැකිනම්, හෝ එම භාණ්ඩ ප්‍රමාණයම වඩා අඩු පිරිවැයක් යටතේ නිපදවිය හැකිනම්, එය හඳුන්වනු ලබන්නේ:

(1) නිරපේක්ෂ වාසිය ලෙසයි. (2) වෙළෙඳ අනුපාතය ලෙසයි.

(3) සාපේක්ෂ වාසිය ලෙසයි. (4) ආරක්ෂණවාදය ලෙසයි.

1.8 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තියේ ගුණාත්මක උපකරණයක් වන්නේ කුමක් ද?

(1) බැංකු පොලී අනුපාතිකය.

(2) විවෘත වෙළෙඳපොළ මෙහෙයුම්.

(3) සංචිත අනුපාතිකය (reserve rate).

(4) ණය සඳහා කල්පිරීමේ උපරිම කාලසීමාවක් පැනවීම.

1.9 පටු මුදල් සැපයුම, මහජනතාව සතු වාණිජ බැංකුවල ඇති කාලීන සහ ඉතුරුම් තැන්පතුවල එකතුව හඳුන්වනු ලබන්නේ:

(1) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ලෙසයි. (2) පුළුල් මුදල් සැපයුම ලෙසයි.

(3) පුළුල් මුදල් ගුණකය ලෙසයි. (4) වඩාත් පුළුල් මුදල් සැපයුම ලෙසයි.

1.10 පහත සඳහන් ඒවා අතුරෙන්, ගෙවුම් ශේෂ ලේඛණයේ ජංගම ගිණුමේ ඇතුළත් **නොවන්නේ** කුමක් ද?

(1) සෘජු විදේශ ආයෝජන. (2) භාණ්ඩ සහ සේවා අපනයනය.

(3) භාණ්ඩ සහ සේවා ආනයනය. (4) ප්‍රාථමික ආදායම්.

*අංක 1.11 සහ 1.12 ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමග, උත්තර පොතේ ලියන්න.*

1.11 දී ඇති කාලපරිච්ඡේදය තුළ නිමැවුමෙහි ඒකකයක පිරිවැය, …………………… *(සාමාන්‍ය පිරිවැය / ආන්තික පිරිවැය)* ලෙස හඳුන්වනු ලැබේ.

1.12 නිමැවුමේ සමානුපාතිකව වැඩිවීම, යෙදවුමේ සමානුපාතික වැඩිවීමට වඩා …………………… *(වැඩි / අඩු)* වූ විට, වැඩිවන පරිමාණානුකූල ඵල (returns to scale) ඇති වේ.

*අංක 1.13 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය* ***සත්‍ය*** *හෝ* ***අසත්‍යදැයි*** *දක්වන්න.* ***සත්‍ය*** *හෝ* ***අසත්‍ය*** *යන උත්තරය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.13 වෙළෙඳපොළ සමතුලිතයේදී ඉල්ලුමේ අතිරික්තයක් තිබේ.

1.14 ආන්තික උපයෝගිතාවය යනු දී ඇති කාලපරිච්ඡේදය තුළ අතිරේක භාණ්ඩ ඒකකයක් පරිභෝජනය කිරීමෙන් පුද්ගලයෙකු ලබන අතිරේක තෘප්තියයි.

1.15 ඉල්ලුම් නීතියට අනුව භාණ්ඩයක මිල සහ ඉල්ලුම් ප්‍රමාණය අතර ධන (අනුලෝම) සම්බන්ධතාවයක් තිබේ.

*අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.16 ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න සඳහන් කරන්න.

1.17 හීනවන ආන්තික ඵලදා න්‍යාය (law of diminishing marginal returns) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

1.18 ඒකාධිකාරයේ ලක්ෂණ (characteristics) දෙකක්(02) සඳහන් කරන්න.

1.19 ජාතික ආදායම් ගිණුම්වල සීමා (limitations) දෙකක්(02) සඳහන් කරන්න.

1.20 සාර්ව ආර්ථික අරමුණු (macroeconomic objectives) දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස
(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) එකිනෙකට උදාහරණයක් සමඟ ආර්ථික භාණ්ඩ, ආර්ථික නොවන භාණ්ඩවලින් **වෙනස්කොට දක්වන්න**. (ලකුණු 03)

(b) සැලසුම්ගත ආර්ථිකයක ලක්ෂණ හතරක්(04) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 04)

(c) ආර්ථික විද්‍යාවේ එන ආවස්ථික පිරිවැය යන සංකල්පය උදාහරණයක් සමඟ **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

(a) **A නිෂ්පාදිතයේ** ඉල්ලුම් (Qd) සහ සැපයුම් (Qs) සමීකරණයන් පහත පරිදි වේ:

$$Qd = 180 - 4p$$

$$Qs = -20 + 6p$$

ඉහත තොරතුරු භාවිත කරමින්,

(i) සමතුලිත මිල සහ ප්‍රමාණය **ගණනය කරන්න**. (ලකුණු 03)

(ii) පාරිභෝගික අතිරික්තය (consumer’s surplus) **ගණනය කරන්න**. (ලකුණු 02)

(b) මිල ඉල්ලුම් නම්‍යතාවය තීරණය කරන සාධක (factors) දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(c) වෙළෙඳපොළ ආර්ථිකයකට රජය මැදිහත්වන ක්‍රම (ways) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

(a) (i) මුදලේ ලක්ෂණ දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(ii) විද්‍යුත් මුදල් (electronic money) භාවිතයට හේතු දෙකක්(02) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 02)

(b) ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් (functions) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) මුදලට ඇති ඉල්ලුම සඳහා චේතනා (motives) දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

(a) පූර්ණ තරඟකාරී ආයතන, කෙටිකාලයේදී ලාභ උපරිම කරගන්නේ කෙසේදැයි ප්‍රස්තාර කොළයක් භාවිත කර **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) කෝවිඩ්-19 (COVID-19) වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති වූ ප්‍රතිවිපාක (consequences) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

## **06** වන ප්‍රශ්නය

(A) (a) අන්තර්ජාතික වෙළදාමේ වාසි හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(b) ස්ථාවර විනිමය අනුපාතිකය (fixed exchange rate) සහ නම්‍ය විනිමය අනුපාතිකය [flexible (floating) exchange rate] අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(B) ජාතික ආදායම් ගිණුම් පිළියෙල කිරීමේ වැදගත්කම සඳහා දැක්විය හැකි හේතු තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(C) වර්ෂයක කාලපරිච්ඡේදයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් කල්පිත දත්ත (hypothetical data) ඔබට ලබා දෙනු ඇත:

| | **රු. මිලියන** |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම් | 2,000 |
| රජයේ පරිභෝජන වියදම් | 1,500 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 1,200 |
| අපනයන | 1,800 |
| ආනයන | 1,250 |
| විදේශ ශුද්ධ සාධක ආදායම<br>(විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම) | - 800 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

වියදම් ප්‍රවේශය (expenditure approach) භාවිත කරමින්, පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) වෙළෙඳපොළ මිලට දළ දේශීය වියදම [Gross Domestic Expenditure (GDE)]. (ලකුණු 04)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 03)

(c) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 03)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන ඇ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |